## කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය - 2011

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය ව්‍යාවනය

මෙම වාර්තාවේ 1.2.1, 1.2.2 සහ 1.2.3 ඡේද වල දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතු කොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම්

1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 05ට පටහැනිව ගබඩා තොග අයිතමයන් යටතට නොගැනෙන වටිනාකම රු.777,777ක් වු පොත්පත් හා ග්‍රන්ථ 1,682 ක් අනුචිත ලෙස තොග යටතේ ගිණුම්ගත කර තිබුණු අතර රු.771,683 ක් වටිනා ග්‍රන්ථ 115 ක් මූල්‍ය ප්‍රකාශන වල ගිණුම්ගත කර නොතිබුණි.

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) විදේශීය ශිෂ්‍යාවක් වෙනුවෙන් ඇයගේ අධ්‍යයන වියදම් පියවා ගැනීම සඳහා ආයතනය විසින් දරන ලද රු.97,276ක වියදම සමාලෝචිත වර්ෂය තුළ ප්‍රතිපූර්ණය වී තිබුණු අතර, එම අගය අදාල වියදම් ගිණුම් වලට ගැළපීමෙන් තොරව පොදු සංචිත ගිණුමට ගැළපීම් කොට තිබුණි.

(ආ) 2010 ඔක්තෝබර් 20 දින තායිලන්තයේ පවත්වන ලද සම්මන්ත්‍රණයකට සහභාගී වීම පිණිස විදේශගත වු ශිෂ්‍යයින් 05 දෙනෙකු සඳහා වියදම් ප්‍රතිපූර්ණය කිරීම වෙනුවෙන් රු.131,775ක මුදලක් ගෙවා තිබුණු අතර, එම මුදල වර්ෂයේ වියදමක් ලෙස සලකා අධ්‍යයන පර්යේෂණ හා ප්‍රකාශන ගිණුමට අනුචිත ලෙස හර කිරීම හේතුවෙන් වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් පෙන්නුම් කෙරේ.

(ඇ) පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අනුයුක්ත විදුලි අධිකාරීවරයෙකු ආයතනයේ සේවය කිරීම වෙනුවෙන් 2010 අප්‍රේල් සිට 2011 ජුනි දක්වා කාලයට අදාලව රු.14,000 ක ගාස්තුවක් පුද්ගලික විශේෂ සේවා ගිණුමට හර කර ගෙවා තිබුණි. ඒ තුළ අඩංගු 2010 අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා කාලයට අදාල රු.9,000 ක වියදම වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගත කර තිබීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් වියදම වැඩියෙන් පෙන්නුම් කර තිබුණි. 2011 අගෝස්තු සිට 2012 ජුලි දක්වා කාලයට අදාල ඡායාස්ථ පිටපත් යන්ත්‍ර වාර්ෂිකව සේවා ගිවිසුම් අලුත් කිරීම සඳහා රු. 31,740 ක් ගෙවා තිබුණු අතර ඒ තුළ අඩංගු ඉදිරි වර්ෂයට අදාල රු. 18,515 ක වියදම වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ඇ) 2010 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතියක සම්බන්ධීකරණ කටයුතු වෙනුවෙන් එම වර්ෂය සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා තිබුණද, ඒ වෙනුවෙන් දරන ලද රු.12,000 ක වියදමක් වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ වියදම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) 2010 පෙබරවාරි 09 දින ප්‍රධාන ගබඩාවෙන් නිකුත් කරන ලද රු.6,000 ක් වටිනා ටෝනර් සඳහා වූ වියදම වර්ෂයේ වියදමක් ලෙස අනුචිත ලෙස රසායනික සැපයුම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඊ) රු.66,380 ක් වැය කර සිලිං විදුලි පංකා 12ක් මිලදී ගෙන තිබුණු අතර, එම වටිනාකම ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කිරීමෙන් තොරව වෙනත් සැපයුම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(උ) රුහුණු විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරයෙකුට ඉකුත් වර්ෂයන්හි දින 03 ක් තුළ පවත්වන ලද සම්මන්ත්‍රණ සඳහා රු.60,000 ක් සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණු අතර, එම මුදල වර්ෂයේ වියදමක් ලෙස සම්මන්ත්‍රණ ගිණුමට හර කර තිබුණි.

(ඌ) 2010 දෙසැම්බර් මාසයට අදාළව මහාචාර්යවරයෙකු වෙත ගෙවන ලද රු.25,452 ක් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කිරීමෙන් වර්ෂයේ වැටුප් වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් පෙන්වා තිබුණි.

(එ) ඉකුත් වර්ෂය තුළ බාහිර දේශන ගාස්තු සඳහා වෙන් කිරීම රු.1,117,550 ක් වුවද, ඊට අදාළව සමාලෝචිත වර්ෂයේදී දරන ලද වියදම රු.3,985,475 ක් වූ අතර ශේෂය බාහිර දේශන ගාස්තු ගිණුමට හර කර තිබීම හේතුවෙන් දේශන ගාස්තු වියදම් රු.2,867,925 ක් වැඩියෙන් පෙන්වා තිබුණි.

(ඒ) පේරාදෙණිය විශ්වවිද්‍යාලය විසින් නඩත්තු කරන ලේඛන පරිදි ආයතනය විසින් භාවිතා කරන ලද ජල හා විදුලි ගාස්තු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු වියදම රු.442,012ක් වුවද, ඊට අදාළව ගිණුම්ගත කර ඇති වටිනාකම රු.287,128ක් වුයෙන් රු.154,884ක වියදමක් අඩුවෙන් දක්වා තිබුණි.

1.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| ගිණුම් විෂයය | මුදල | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ස්ථාවර වත්කම් | 121,319,780 | ස්ථාවර වත්කම් ලේඛනය සහ උපලේඛන |
| පුස්තකාල පොත් | 33,387,254 | සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| | 154,707,034 | |

1.2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීතිරීති, රෙගුලාසී යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 8(3) වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ආදායම්, වියදම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, මූලධන වියදම් ඇස්තමේන්තුව, 2011 දෙසැම්බර් 31 දිනට අයවැයගත ශේෂ පත්‍රය, වාර්ෂික අයවැය ලේඛනය සමඟ ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| i. මු.රෙ. 188 | පේරාදෙණිය ලංකා බැංකුවේ ජංගම ගිණුමෙහි 2003 සිට 2010 ජුලි දක්වා කාලයට අදාළ තැන්පත් කළ නමුත්, නිශ්කාෂණය නොවූ රු.10,230ක් වටිනා චෙක්පත් 06ක් හා පේරාදෙණිය මහජන බැංකුවේ ජංගම ගිණුමෙහි 2011 දෙසැම්බර් මස බැංකු සැසඳුමේ සඳහන් තැන්පත් කළ නමුත්, නිශ්කාෂණය නොවූ රු.7,440ක් වටිනා චෙක්පත් 02ක් සහ මුදල් ඇණවුම් 15ක් සම්බන්ධයෙන් කටයුතු කර |

නොතිබුණි.

| | |
|---|---|
| ii. මු.රෙ. 371 | i. කථිකාචාර්යවරයෙකුට 2011 පෙබරවාරි 28 දින ලබාදුන් රු.10,000ක අත්තිකාරම් මුදලක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන මාස 03කට පසු පියවීම් කර තිබුණි.<br><br>ii. තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදිය හැක්කේ මාණ්ඩලික ගණයට අයත් නිලධාරීන්ට පමණක් වුවද, සමාලෝචිත වර්ෂයේ රු.13,870ක මුදලක් පශ්චාත් උපාධි පාඨමාලා හදාරන ශිෂ්‍යයෙකුට ලබා දී තිබුණි. |
| iii. මු.රෙ. 371(5) | තත්කාර්ය අතුරු අග්‍රිම එය දෙන ලද කාර්ය නිම කළ විගස පියවිය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ දී ලබා දුන් රු.221,092 ක් වු අත්තිකාරම් 02ක් වර්ෂය අවසානය වන විටත් පියවීම් කර නොතිබුණි. |
| iv. මු.රෙ. 571 | අවුරුදු 2 ට වැඩි තැන්පතු ආදායමට ගැනීමට හෝ නිසි ක්‍රියාමාර්ගයන් අනුගමනය කර නිරවුල් කර ගත යුතු වුවද, වටිනාකම රු.118,003ක් වු කොන්ත්‍රාත් තැන්පතු එපරිදි නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| v. මු.රෙ. 880 | රජයේ මුදල්, ආදායම්, බඩු බාහිරාදිය භාරව සිටින නිලධාරීන් මෙන්ම වවුචර් සහතික කරන චෙක්පත් අත්සන් කරන අය විසින් ප්‍රමාණවත් පරිදි ඇප තැබිය යුතු වුවද, අධ්‍යක්ෂ, සහකාර ලේඛකාධිකාරි, ජ්‍යෙෂ්ඨ මූල්‍යාධිකාරි, මුදල් අයකැමි, ගබඩා භාරකරු යන අය විසින් එසේ ඇප තබා නොතිබුණි. |
| (ඇ) 2002 නොවැම්බර් 28 දින හා අංක අයිඑ්අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක යන්ත්‍රවලට අදාළව ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඈ) | විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය<br>IX පරිච්ඡේදයේ 08 ඡේදය | මාසික අතිකාල ප්‍රමාණය මාසික ඒකාබද්ධ වැටුපෙන් 35% ක් නොඉක්මවිය යුතු වුවද, ඊට පටහැනිව එම සීමාව ඉක්මවා සේවකයින් 13 දෙදෙනෙකු වෙත අවස්ථා 49 දී රු.87,397ක් ගෙවා තිබුණි. |
| (ඉ) | රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ 2003 ජුනි 02 දිනැති PED/12 චක්‍රලේඛය | |
| | i. 7.4.5 ඡේදය | ස්ථාවර වත්කම් සමීක්ෂණය කර නොතිබුණි. |
| | ii. 8.3.5 ඡේදය | අධ්‍යක්ෂවරයා සඳහා මාසික ඉන්ධන සීමාව පෙට්‍රල් වාහනයක් සඳහා ලීටර් 180ක් වුවද, මාස 03 ක් තුළ එම සීමාව ඉක්මවා ඉන්ධන ලීටර් 168ක් ලබාගෙන තිබුණි. |
| | iii. 8.8 ඡේදය | කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන කාර්ය මණ්ඩලය වෙත බලතල බෙදා දිය යුතු වුවද, නිලධාරීන් 47 දෙනෙකු සම්බන්ධයෙන් එසේ බලතල බෙදා දී නොතිබුණි. |
| (ඊ) | 1990 ඔක්තෝබර් 10 දින අංක:41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | මාස 06කට වරක් වාහනවල ඉන්ධන දහනය පිළිබඳව පරීක්ෂණ පැවැත්වියයුතු වුවද, ආයතනය සතු වාහන 04ක් සම්බන්ධයෙන් එසේ පරීක්ෂණ පවත්වා නොතිබීම නිසා, විවිධ ප්‍රමාණයන් යොදා ඉන්ධන තුලනය කර තිබුණි. |
| (උ) | කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 18 ඡේදය | ආයතනගත නිලධාරීන්ගේ සුභසාධන කටයුතු සඳහා වියදම් දැරීමට අවකාශ සැලසී නොතිබුණද සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 03කදී රු.34,000 ක මුදලක් එබඳු කටයුතු සඳහා වැය කර තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ ආයතනයේ වැඩකටයුතුවලින් පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන ගණන් ගැනීමට පෙර රු.5,369,318 ක ඌනතාවයක් වූ අතර, පුනරාවර්තන වියදම් සඳහා වූ රු.22,585,072 ක් වූ රජයේ ප්‍රදාන ගණන් ගැනීමෙන් පසු එම ඌනතාවය රු.17,215,754 ක අතිරික්තයක් ලෙස වර්ධනය වී තිබුණි. ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර වූ අතිරික්තය රු.1,770,860 ක් වූ අතර, පුනරාවර්තන වියදම් සඳහා රු.18,000,000 ක් වූ රජයේ ප්‍රදාන ගණන් ගැනීමෙන් පසු එය රු.19,770,860 ක අතිරික්තයක් දක්වා වර්ධනය වී තිබුණි.

### 2.2 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොව ගනුදෙනු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 1978 මාර්තු 10 දිනැති අංක පිඊ/1/774/11 (බී) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි විධිවිධානවලට පටහැනිව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කර තිබූ චක්‍රලේඛ උපදෙස් මත දෙවන හා තෙවන භාෂා ප්‍රවීණතා දීමනා ලෙස 1996 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු.1,193,432 ක් ගෙවා තිබුණි.

(ආ) 2003 ජුලි 18 දිනැති අංක පිඩී/අයි/එන්එස්/ඩීඑල්/ජීඑස්/ඒ 078 දරන අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛ ලිපිය පරිදි සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල වෙනුවෙන් දායක මුදල් ගණනය කිරීමේ දී අධ්‍යයන දීමනා අදාළ කර නොගත යුතු වුවද, එයට පටහැනිව ගණනය කිරීම හේතුවෙන් 2001 සිට 2011 වර්ෂය දක්වා රු.2,724,475ක් වූ අධ්‍යයන දීමනා වෙනුවෙන් රු.490,403ක දායක මුදල් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) 2003 නොවැම්බර් 29 දිනැති අංක 837 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය අභිබවා එළඹී 2004 නොවැම්බර් 24 දිනැති අංක 150.2.1 දරන කළමනාකරණ මණ්ඩල තීරණය පරිදි සමාලෝචිත වර්ෂය තුළ බාහිර කථිකාචාර්යවරුන් විසින් ප්‍රතිඵල කඩිනමින් ලබාදීම වෙනුවෙන් 10% බැගින් රු.156,375 ක ප්‍රසාද දීමනා ගෙවා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යයන කටයුතුවල නිරත වූ පශ්චාත් උපාධි අපේක්ෂකයින් සංඛ්‍යාව 1255 දෙනෙකු වු අතර, ඒ වෙනුවෙන් දරන ලද වියදමට සාපේක්ෂව ඒක ශිෂ්‍ය පිරිවැය රු.41,669 ක් වු අතර, ඉකුත් වර්ෂයේදී එම අගය රු.31,402 ක් වී තිබුණි.

(ආ) පර්යේෂණ කටයුතු සිදු කිරීම ආයතනයේ ප්‍රධාන අරමුණක් වී තිබුණද, පසුගිය වර්ෂ 5 ක කාලයක් තුළ අභ්‍යන්තර පර්යේෂණ වෙනුවෙන් කිසිදු වියදමක් දරා නොතිබූ එම පර්යේෂණ 07 සඳහා සහභාගි කර ගන්නා ලද ශිෂ්‍ය සංඛ්‍යාව 21කට පමණක් සීමා වී තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ රු.15,298,947 ක් වටිනා බාහිර පර්යේෂණ 07ක් සිදු කර තිබුණි. මේ හේතුවෙන් රු.1,780,695 ක් වැය කර සමාලෝචිත වර්ෂය තුළ පවත්වන ලද වාර්ෂික සමුළුව මගින් එළි දක්වන ලද සියලුම පර්යේෂණ බාහිර පර්යේෂණ ප්‍රතිඵල වලට සීමා වී තිබුණි.

### 3.2 අරමුදල් ඌන උපයෝජනය

පර්යේෂණ කටයුතු සඳහා මුදල් වෙන් කර නොතිබියදීත්, වර්ෂය තුළ බාහිර පර්යේෂණ 07 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණු අතර, 2004 සිට 2011 අතර කාල සීමාවකට අයත් රු.1,008,769 ක පර්යේෂණ 07ක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන පැවතුණි.

### 3.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) භාවිතයට ගත නොහැකි පරිගණක මේස 09ක් සහ පරිගණක උපාංග 28 ක් සම්බන්ධයෙන් ගිණුම්වල ගැලපීමට හෝ අපහරණය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ආ) 2003 සිට 2008 දක්වා මිලදී ගන්නා ලද ශිෂ්‍ය අත්පොත් වලින් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් රු.123,264 ක් වටිනා පොත් 1,200 ක් නිෂ්ක්‍රීයව පැවතුණි.

(ඇ) රු.49,000 ක් වැය කර පරිගණක මෘදුකාංගයක් මිලදී ගෙන තිබුනද, 2012 ජුනි මස වන විටත් එම මෘදුකාංගය ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

3.4 ආර්ථික නොවූ ගනුදෙනු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත හා කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 1979 අංක 09 දරන නියමාවලියට අනුව ආයතනය යටතේ කුමන හෝ මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ඉඩකඩ සැලසී නොතිබියදී, කළමණාකරණ මණ්ඩලයේ අනුමැතියකින් තොරව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරුන් 02 දෙදෙනෙකු සහ වැඩසටහන් සම්බන්ධීකාරකවරයෙකු බඳවා ගෙන 2008 සිට 2010 වර්ෂය දක්වා ඔවුන් වෙත රු.1,608,000 ක දීමනා ගෙවමින් ව්‍යාපෘති කටයුතු කිරීම උදෙසා ජාතික කාබනික මධ්‍යස්ථානය (NCOA) සහ ශක්තින් උත්පාදනය කිරීමේ මධ්‍යස්ථානය (CRES) නමින් මධ්‍යස්ථාන 02ක් පිහිටුවා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් එම මධ්‍යස්ථාන 02 ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවතුණි. තවද, මෙම මධ්‍යස්ථාන වෙත වර්ෂ 03 කට ප්‍රථම උපදේශන ගාස්තු, සම්පත්දායක දීමනා, වැඩමුළු පැවැත්වීම හා වෙබ් අඩවියක් ඇරඹීම යන කරුණු වෙනුවෙන් ලබා දී තිබුණු රු.2,867,220 ක ප්‍රදානයක් උපයෝගි කර ගෙන අදාල කාර්යයන් ඉටු කර නොතිබුණි.

(ආ) කාබනික ගොවිපල් ආකෘතියක් සකස් කිරීම සඳහා රු.1,800,000ක ඇස්තමේන්තුගත අගයක් මත කළමනාකරණ මණ්ඩලයේ අනුමැතියකින් තොරව 2009 ඔක්තෝබර් මසවන විට පෞද්ගලික ආයතනයකින් රු.300,000ක මුදලක් ලැබී තිබුණු අතර, එම කාර්යය 2012 ජූනි මස වන විටද ආරම්භ කර හෝ නොතිබුණි.

3.5 හඳුනාගන්නා ලද පාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2008 සැප්තැම්බර් 27 දින විශ්‍රාමගොස් සිටි පීඨයට අයත් පුස්තකාල සේවකයෙකු වෙත පාර්තෝෂික දීමනා ගෙවීම ප්‍රමාදවීම හේතුවෙන් රු.33,635ක අධිභාර මුදලක් 2011 ජූනි 18 දින මුදල් කම්ටු නිර්දේශය මත සහකාර කම්කරු කොමසාරිස් වෙත ගෙවා තිබුණු අතර, මු.රෙ.119 පරිදි එම අධිභාර මුදල වගකිවයුතු නිලධාරියා වෙතින් අයකර ගැනීමට කටයුතු නොකර එම මුදල අනුචිත ලෙස විශ්‍රාම පාර්තෝෂික ගිණුමට හර කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ පර්යේෂණ ව්‍යාපෘති සඳහා වූ ගිවිසුමේ අංක 7(iii) පරිදි ව්‍යාපෘතියට අදාළ පර්යේෂණ කටයුතු අවසන් වූ පසුව එහි ස්ථාවර වත්කම් ආයතනයට පැවරිය යුතු වුවද, පර්යේෂණ කටයුතු නිම කරන ලද ව්‍යාපෘති 04කට අදාළ රු.1,415,374ක් වූ ස්ථාවර වත්කම් 2011 දෙසැම්බර් වන විටත් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.6 ප්‍රමාද වූ ව්‍යාපෘති

ආයතනයේ පරිගණක පුහුණු මධ්‍යස්ථානයට ඇතුළුවන සිසුන් හඳුනාගැනීම පිණිස ආරක්ෂිත ක්‍රමවේදයක් ලෙස රු.216,092 ක වියදමකින් සංඛ්‍යාත හැඳුණුම්පත් පද්ධතියක් ස්ථාපිත කර තිබුණද, හැඳුණුම්පත් පිළියෙල කිරීමේ ප්‍රමාදය හේතුවෙන් විගණන පරීක්ෂණ අවස්ථාව වූ 2012 ජුනි මස වන විටත් එම කාර්යය ක්‍රියාත්මක තත්ත්වයේ නොතිබුණි.

3.7 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සංඛ්‍යාව 10 ක් වූ අතර, එම තනතුරු පිරවීමට කටයුතු නොකර, ආයතනයේ දේශන සඳහා බාහිර දේශකවරුන් බඳවා ගෙන, බාහිර දේශන ගාස්තු වශයෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.7,308,925 ක් ගෙවා තිබුණි.

(ආ) අංක පිරිඩි/12 හා 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 09 ඡේදය පරිදි මානව සම්පත් අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

3.8 සේවක පාර්තෝෂික සඳහා ප්‍රතිපාදන වෙනුවෙන් අරමුදල් ගොඩනැගීම

සේවක පාර්තෝෂික ගෙවීම පිණිස වෙන් කරන ලද රු.8,069,831ක ප්‍රතිපාදන ඵලදායී ආයෝජනයක යෙදවීමට කටයුතු නොකර පැවතුණි.

4. ගිණුම්කරණ කටයුතුභාවය සහ යහපාලනය

4.1 අධ්‍යයන කමිටු

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 14(7) උපපේදය පරිදි එක් වසරක් සඳහා අඩුම තරමින් රැස්වීම් වාර 06ක් ආයතන මණ්ඩල විසින් පැවැත්විය යුතු වුවද, රැස්වීම් වාර 03-05 අතර ප්‍රමාණයක් ආයතන මණ්ඩල 11 ක් විසින් පවත්වා තිබුණි.

4.2 ප්‍රසම්පාදන සැලැස්ම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය තුළ රු.736,714ක් වටිනා ස්ථාවර වත්කම් මිලදී ගෙන තිබුණද, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය සහ ප්‍රසම්පාදන අත්පොතෙහි 4.2.1 පරිදි ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළයුතු වුවද, එසේ පිළියෙල කර නොතිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 වගන්තිය ප්‍රකාරව, ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙල කර නොතිබුණි.

4.3 අයවැය පාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආදායම් විෂයයන් 08කට අදාළව ඇස්තමේන්තුගත ආදායම ඉක්මවා රැස් කර තිබුණු ආදායම රු.10,764,090ක් වු අතර, එහි ප්‍රතිශතය 0.87% සිට 575% දක්වා පරාසයක පැවතුණි.

(ආ) අය විෂයයන් 10කට අදාළව එකතුව රු.13,798,118 ක් වු ආදායම් ඇස්තමේන්තුගත ආදායම කරා ලගා වී නොතිබුණු අතර, එහි ප්‍රතිශතය 16% සිට 88% දක්වා පරාසයක පැවතුණි.

(ඇ) මුදල් රෙගුලාසි 50(ii) පරිදි, වාර්ෂික ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිවත්, සම්පූර්ණවත්, පිළියෙල කිරීමට ගණන්දීමේ නිලධාරීන් වග බලා ගත යුතු වුවත්, වැය විෂයයන් 30කට අදාළ ඉතිරිය රු.20,083,444 ක් වී තිබූ අතර, එහි ප්‍රතිශතය 9% සිට 98% දක්වා පරාසයක පැවතුණි.

(ඈ) වැය විෂයයන් 17කට අදාළව ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ඉක්මවා දරන ලද වියදම රු.3,649,839ක් වු අතර, එහි ප්‍රතිශතය 1% සිට 159% ක් දක්වා වු පරාසයක පැවතුණි.

4.4 වාර්ෂික වාර්තා සහාගත කිරීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන චක්‍රලේඛයේ 6.3.1 ඡේදය පරිදි ඉදිරිපත් කරන ලද වාර්ෂික වාර්තාවේ විගණනය කරන ලද මූල්‍ය වාර්තා ඇතුළත් කර නොතිබුණු අතර, වාර්ෂික වාර්තාවේ ඇතුළත් කළ යුතු ශිෂ්‍ය තොරතුරු අනුව ශිෂ්‍ය සංඛ්‍යාව 3,903 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) 2010 වර්ෂයට අදාළව පිළියෙල කරන ලද වාර්ෂික වාර්තාව අනුව බෝග සමාකරණ නිරූපකරණය පිළිබඳ පාඨමාලාව සහ පාරිභෝගික අවශ්‍යතාවය මත සිදු කරනු ලබන ආහාර නිෂ්පාදන යන පාඨමාලා ආරම්භ කර ඇති බව දක්වා තිබුණද, 2012 වර්ෂය වන විටත් එම පාඨමාලා ආරම්භ කර හෝ නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අධ්‍යක්ෂවරයා වෙත වරින්වර මාගේ වාර්තා මගින් පෙන්වා දී ඇත. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) ස්ථාවර වත්කම්

(ඇ) අත්තිකාරම්

(ඈ) මිලදී ගැනීම්

(ඉ) පර්යේෂණ හා ප්‍රදානයන් සම්බන්ධ කටයුතු

(ඊ) පුස්තකාල පොත් පරිහරණය

(උ) කෙටිකාලීන පාඨමාලා පැවැත්වීම